# (ඇ) මහ බැංකු කටයුතු

1965 දෙසැම්බර් අවසානයේ දී මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 28·22 ක් විය. මෙයින් 1965 වර්ෂයට රුපියල් කෝටි 14·63 ක වැඩි වීමෙක් පෙනේ. මේ වැඩිවීමෙන් 1965 මැයි මාසයේදී මහ බැංකුව විසින් රජයේ ආයතන වලින් මිලයට ගත් රුපියල් කෝටි 3·10 ක් වටිනා විදේශීය සුරැකුම්පත් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් රුපියල් කෝටි 5·35 කට සමාන විදේශීය මුදල (ශුද්ධ) පිළිබිඹු වෙයි. 1965 මුල් භාගයේ දී මහ බැංකුව, පිටරට වෙළෙඳ බැංකු වලින් තාවකාලික ණය පහසුකම් ලබාගත් අතර, ජූලි මාසයේ දී එය සම්පූර්ණයෙන්ම ගෙවා දමන ලදී. එම නිසා වර්ෂාවසාන තත්ත්වයෙන් මෙකී කෙටි කාලීන ණය ගැනීම් පිළිබිඹු නොවීය. ජූනි මාසයේ දී මදක් අඩු වුවද, වර්ෂයේ මුල් මාස දහයේ දී ජාත්‍යන්තර සංචිතය වැඩි වන බවක් පෙන්වීය. ඔක්තෝබර් අවසානයේදී රුපියල් කෝටි 32·03 ක්ව උපරිම මට්ටමට නැග තුබූ සංචිතය නොවැම්බර් හා දෙසැම්බර් මාස වල දී සැලකිය යුතු ලෙසට අඩු විය. නොවැම්-බර් අවසානයට රුපියල් කෝටි 28·83 කට අඩුවූ මෙය දෙසැම්බර් අවසාන යට රුපියල් කෝටි 28·23 කට අඩුවිය.

මහ බැංකුවේ මුළු දේශීය වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 144·38 ක් වූයේ 1957 ට පසු ප්‍රථම වරට රුපියල් කෝටි 0.54 ක හෙවත් සියයට 0·4 ක අඩුවක් ඇති විය. මෙකී අඩුවීමට හේතු වූයේ භාණ්ඩාගාර බිල්පත් මගින් මුදල් ගැනීම් වැඩි නොකිරීමට රජය තැත් දැරීමය. 1965[1] දී මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 3·87 කින් අඩු විය. එහෙත් මහ බැංකුව විසින් රජයට දෙනු ල බූ ලෝන හා අත්තිකාරම් රුපියල් කෝටි 2·8 කින් වැඩි විය. අනෙක් අතට මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු වලට දෙනු ලැබූ අත්තිකාරම් රුපියල් කෝටි 1·28 කින් පහළ වැටුන අතර, "අනෙකුත් වත්කම් හා ගිණුම්" රුපියල් කෝටි 1·82 කින් වැඩි විය. මේ නිසා දේශීය වත්කම් (ශුද්ධ) රුපියල් කෝටි 0.54කින් අඩු විය.

### ණය ප්‍රතිපත්තිය

1963 දී රුපියල් කෝටි 13·69 කින් ද, 1964 දී රුපියල් කෝටි 6·28 කින් ද වැඩි වූ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය, 1965 වර්ෂයේ මුල් මාස පහ තුළ රුපියල් කෝටි 4·48 කින් තව දුරටත් වැඩි විය. 1964 වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි, 1963 දී සහ 1964 දී ආනයන සීමා වත් වඩාත් දැඩි කිරීම හා පුළුල් කිරීම නිසාත්, මිල වැඩි වෙතැයි යන බලා පොරොත්තුවෙන් භාණ්ඩ සැඟවීම නිසාත් බැංකු ණය වැඩි වෙමින් පැවතුන හොත් ඉන් මූල්‍ය ඉල්ලුම අධික විය හැක්කේ ය. මූල්‍ය තත්ත්වය පිළිබඳ මහ බැංකුවේ ඇස්තමේන්තු පදනම් කොට මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් විධිවිධාන පනවන ලදී:-

(i) 1960 අගෝස්තු 13 වැනි දින සිට සියයට 4 ක්ව පැවැති බැංකු පොළී අනුපාතිකය 1965 මැයි 28 වැනි දින සිට සියයට 5 දක්වා වැඩි කිරීම.

(ii) ලෝන, අයිරා, මුදල් යෙදවූ ආනයන බිල්පත්, මුදල් යෙද වූ දේශීය බිල්පත් යන වත්කම් ශීර්ෂ සතර යටතේ වූ, වෙළෙඳ බැංකු අත්තිකාරම් වැඩිවීම සීමා කිරීමෙන්, වෙළෙඳ බැංකු විසින් පෞද්ගලික අංශයට[2] දෙන ණය ප්‍රාසාරණයට උපරිම සීමාවක් පනවන ලදී. සීමාව ඇතුළත නිෂ්පාදන කටයුතු

---

1 මහ බැංකුව විසින් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සාධ්‍යාව මේ වාර්තාවේ පරිශිෂ්ටයේ 5 වැනි සංඛ්‍යා සටහනේ රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් ගණය යටතේ වාර්තාකර තිබේ.

2 මීට ඉහතදී අනුගමනය කරන ලද පිළිවෙලට අනුකූලවන පරිදි, රාජ්‍ය සංස්ථාවන්ද පෞද්ගලික අංශයට ඇතුලත් වනසේ අර්ථ නිරූපනය කොට ඇත.

සඳහා උපරිම ණය ප්‍රමාණය දීමට හැකි වනු වස් අත්‍යාවශ්‍ය නොවන කාර්යයන් සඳහා ණය දීම අඩු කිරීමෙහිලා එක් එක් බැංකුවට පනවා ඇති උපරිම සීමාවට අනුකූලව කටයුතු කළයුතු බව මෙකී සීමාව පැනවීමෙන් මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට අවබෝධ කරවන ලදී. වෙළෙඳ බැංකු ණය ප්‍රාසාරණය සීමා කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග සම්මත කර ගන්නා ලද, මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කර ගැනීමේ වැඩ පිළිවෙලෙහි එක් අංගයකි.

(iii) අළුත් බැංකුවක් වශයෙන් මේතාක් මහ බැංකුවේ විශේෂ තැන්පතු තැබීමෙන් නිදහස් කරනු ලැබූ මහජන බැංකුවට, 1965 ජූනි 9 වැනි දින ව්‍යාපාරික කටයුතු අවසන් කරන කල්හි පැවති වගකීම් මට්ටමට වඩා වැඩි වූ කිසියම් වූ ඉල්ලුම් තැන්පතු වෙතොත්, එයින් සියයට 28 ක විශේෂ සංචිතයක් 1965 ජූනි 18 වැනි දින සිට මහ බැංකුවෙහි පවත්වා ගත යුතු යයි නියම කැරිණි. 1961 පෙබරවාරි 10 වැනි දින අනෙකුත් සියළුම වෙළෙඳ බැංකු වලට නියම කැරුන විශේෂ සංචිත අනුපාතය නොවෙනස්ව සියයට 38 හිම පැවතිණි. හැඩගැසෙමින් පවතින ආයතනයක් වන මහජන බැංකුවට 1961 පෙබරවාරි මස පැන වූ විශේෂ සංචිත අවශ්‍යතාවය පැනවීම හිතකර නොවෙතැයි කල්පනා කරන ලදී.

ණයවර ලිපි සහ සමහර ආනයන වර්ග වලට මුදල් යෙදවීමේ කාර්යයන් සඳහා වූ වෙළෙඳ බැංකු අත්තිකාරම්, සඳහා වූ ආන්තික අවශ්‍යතාවන් 1965 නොවැම්බර් මාසයේදී ඉවත් කරන ලදී. මෙයට හේතු වූයේ සියළුම ආනයන ඇතුළත් වන පරිදි අවික්‍ර පාලනයන් දීඝී කිරීමේ හේතුවෙන් ආනයන සීමා කිරීමේ ක්‍රමයක් වශයෙන් ආන්තික අවශ්‍යතාවයන් අනවැසි වීමය.

## බැංකු කටයුතුවල දියුණුව

මහජන බැංකුව විසින් ග්‍රාමීය බැංකු කටයුතු සම්බන්ධයෙන් ඇති කළ නියාමක වැඩ පිළිවෙල, 1965 බැංකු කටයුතු ක්ෂෙත්‍රයෙහි ඇති වූ දියුණුවක් විය. කලින් දක්වූනු පරිදි, ඉකුත් වර්ෂයේ දී ග්‍රාමීය බැංකු වශයෙන් කටයුතු කිරීම සඳහා තෝරාගත් විවිධ සේවා සමූපකාර අට ම 1965 ජූලි වූ විට ක්‍රියාත්මක වෙමින් තිබිණි. මෙකී බැංකු වලට, මහජනයාගෙන් සහ ස්වකීය සාමාජිකයන්ගෙන් ද ඉතිරි කිරීම් තැන්පැතු ලබා ගැනීමට බලය පවරන ලදී. මෙකී ග්‍රාමීය බැංකු වලට ලඟම පිහිටි මහජන බැංකුවෙන් ණය පහසුකම් ද සලසන ලදී. ණය අයකරගැනීම මහජන බැංකුවේ නිලධාරීන් විසින් පරීක්ෂා කැරුන අතර, අවශ්‍ය කල්හි එකී සමිති වලට කළමනාකාර කටයුතු සඳහා සහායද දෙන ලදී. ග්‍රාමීය බැංකු පාලනය සඳහා පත් කැරුන අයට මහජන බැංකුව විසින් පුහුණු කිරීමේ කෙටි කාලීන පාඨමාලාවක් ද සපයනු ලැබේ.

මෙකී ග්‍රාමීය බැංකු සැකසී ඇත්තේ සමූපකාර බැංකු කටයුතු ක්ෂෙත්‍රයෙහි වෙනත් තැනෙක ලැබූ අත් දැකීම් අනුවය. ග්‍රාමීය බැංකු ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක වන අයුරෙන් එය ඒකීය බැංකු ක්‍රමයෙහි හා ශාඛා බැංකු ක්‍රමයේ ඇති වාසි වල සම්මිශ්‍රණනයෙකි. එකී වාසි මේවාය.

(i) එක් එක් සමූපකාරයෙහි කළමනාකාර කමිටුවට, පලාත්බද තත්ත්වය ගැන ඇති දැනුමට අනුව, ණය දීමේ තීරණය විමධ්‍යගත කිරීම. මේ දැනුමට අනුව, ගම්බද පලාත් වල පිහිටි වෙළෙඳ බැංකු ශාඛා කාර්යාල වලට ණය දීම් සම්බන්ධයෙන්, ලොකු බාධාවක්ව තිබුන ඇප පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීමට පහසු වන්නේය.

(ii) එහි ශාඛා සංවිධානය මගින් සම්පත් අධික පෙදෙස් වලින් ඒ ගෙන, මහ ජන බැංකුව මගින් අයිරා පහසුකම් සැලසීම.

(iii) මධ්‍යගත පාලනය හැකි අවම පමණට අඩු කොට කාර්ය මණ්ඩලයට සේව කයන් පළාත් බදින් බඳවා ගැනීමෙන් ඇති වන සැකසුරුවම නිසා, ක්‍රියාකාරී වියදම් අඩුවීම.

වෙලෙඳ බැංකු වල සහායද ඇතිව මහ බැංකුවේ අනුග්‍රහයෙන් ඇරඹුන බැංකු කරුවන් පුහුණු කිරීමේ ආයතනය 1965 තුළ දී ශීඝ්‍ර දියුණුවක් ලබා ඇත. 1965 මැයි මාසයේ පවත්වන ලද ප්‍රථම පරීක්ෂණයට විභාගාපේක්ෂකයෝ 293 ක් පෙනී සිටියහ. 1966 පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන විභාගාපේක්ෂකයන් සඳහා වූ පාඨ මාලාවට නිබන්ධන සමග පුළුල් දේශන මාලාවක් ඇතුළත් වන අතර, 1965 සිට පුස්තකාල පහසුකම් ද අරඹා ඇත. වර්ෂය අවසන්වන විට, ලේඛනගතව සිටි ශිෂ්‍යයන්ගේ මුළු සංඛ්‍යාව 1,200 ක් විය.

1965 අගෝස්තු මාසයේදී, මහ බැංකුව "බැංකු කටයුතු වර්ධනය" සඳහා බැංකු නිලධාරීන්ගෙන් සැදුන කමිටුවක් පත්කරන ලදී. පහත සඳහන් කරුණු වාර්තා කිරීමට කමිටුවට නියමිතය.:-

(i) දැනට පවත්නා, ණය, බැංකු කටයුතු හා ඉතිරි කිරීම් පහසුකම් වල පවත්නා ඌනතා

(ii) එවැනි ඌනතා මග හැරවීමට කෙළින් ම මහ බැංකුව විසින් ක්‍රියා කිරීමෙන් හෝ දැනට පවත්නා වෙනත් කිසියම් ආයතනයක් මගින් හෝ අළුත් ආයතනයක් පිහිටුවීමෙන් හෝ ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කිරීම.

මේ කමිටුවේ අතුර නිර්දේශයක් උඩ මහ බැංකුවේ බැංකු පරිපාලන දෙපාර්ත-මේන්තුවේ සංවර්ධන මුදල් අංශයක් ඇති කිරීමට, මුදල් මණ්ඩලය අනුමත කොට ඇත. මේ අළුත් අංශය පිහිටුවා ඇත්තේ, කර්මාන්ත හා කෘෂිකර්මය සඳහා කාලීන මුදල් පහසුකම් සලසා ගැනීමේ හැකියාව පිළිබඳව පරීක්සා බැලීමටය. මේ අංශයේ වැදගත් කාර්යය වනුයේ කර්මාන්තවල හා කෘෂිකර්මයෙහි අළුත් ආයෝජන සඳහා යෝජනා ක්‍රම ඇගැයීමේ නෛපුන්‍යතාවයක් ලබා දීමටය.

පොළී අනුපාතිකය අඩු කිරීම හා මුදල් නැවත යෙදවීම යටතේ අනුගමනය කරන ක්‍රියා පිළිවෙල ලිහිල් කිරීම සම්බන්ධව වර්ෂය අවසානයේදී මහ බැංකුවේ සැලකිල්ල යොමුවී තිබිණි. පසුව එකී වෙනස්කම් ක්‍රියාත්මක කරනු ලැබීය.